**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය - 2021**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි සඳහන් නියමයන්ට පටහැනිව මාස 6 කින් සහ මාස 12 කින් කල්පිරෙන රු.524,500,000 ක්වූ ස්ථාවර තැන්පතුවල අගයන්ද මුදල් හා මුදලට සමාන වටිනාකම් ලෙස අදාළ කර ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මුදල් සහ මුදල් සමාන වටිනාකම් ශේෂය එම අගයෙන්ම අධිගණනය වී තිබුණි. එසේම, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන ලද රු.916,500,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය එම අගයෙන්ම ඌන ගණනය වී තිබුණි. | මාස 6ක් සහ මාස 12 කින් කල්පිරෙන ස්ථාවර තැන්පතු, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇතිවන මුදල් ප්‍රවාහයක් යටතේ දැක්වීමට අද දින සිට කටයුතු කරනු ලැබේ.<br><br>විගණනයෙන් පෙන්වා දෙන පරිදි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම් සහ තැන්පතු ඉවත් කර ගැනීම් ශුද්ධ පදනම මත වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. ආයෝජනය කරනු ලබන මුදල් සහ ස්ථාවර තැන්පතුවල මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් වහාම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුලත් කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදෙන ලදී. | මුදල් සහ මුදල් සමාන දෑ යටතේ මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් වැනි කෙටි කල්පිරීමේ කාලයක් පවතින ආයෝජනයන් පමණක් දැක්විය යුතුය.<br><br>ස්ථාවර තැන්පතු වල සිදුකරන ආයෝජන මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 8.4 අනුව පිරිවැය රු.මිලියන 4.9 ක් වූ අනුරාධපුර තුරු ඉතුරුගම නිවාස 6 ක් සංචාරක බංගලා වශයෙන් පත්වාගෙන යනු ලබන බව දක්වා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 "දේපළ පිරියත හා උපකරණ" හි වගන්ති අංක 7 අනුව එම නිවාස ආයෝජන දේපලක් ලෙස හඳුනා නොගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. එමෙන්ම පිරිවැය රු. මිලියන 36.62 ක් වූ අධිකාරිය විසින් බදු පදනම මත ලබා දි ඇති සිංහපුර නිවාස 15 ක් ආයෝජන දේපළක් ලෙස හඳුනා නොගෙන ජංගම වත්කමක් යටතේ දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දෙන පරිදි අනුරාධපුර නිවාස ව්‍යාපෘතියේ ඉතිරිව ඇති සංචාරක බංගලා වශයෙන් පවත්වා ගැනිමට යෝජිත නිවාස 06 සහ සිංහපුර බදු පදනම මත ලබාදී ඇති නිවාස 15 ආයෝජිත දේපලක් ලෙස වෙනම ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයට පෙර පැවති රු. මිලියන 716.11 ක රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | රාජ්‍ය ප්‍රදාන මගින් 2020 වර්ෂයෙන් පසු සිදු කරන ලද ව්‍යාපෘති බැහැර කිරීම සඳහා ප්‍රතිපත්ති තීරණගෙන ගිණුම් ගත කිරීමට අදාළවන ගිණුම් කරන ප්‍රතිපත්තිය නිවැරදිව හඳුනාගෙන 2021 වර්ෂයේ ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලැබිය යුතු රු. මිලියන 206.77 ක මුළු ණය අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කර එහි සම්පූර්ණ හානිකරන අගය හඳුනා ගැනීමට කටයුතු නොකර එම ශේෂයට සියයට 5 ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කර තිබුණි. | මේ වන විට අධිකාරියේ ණය අයකිරීම් අංශය විසින් සියලුම ණය, ක්‍රමවත්, අක්‍රමවත් සහ කල් පසුවූ ණය වශයෙන් වර්ගීකරණය කිරීම සිදුකර ඇත. ඒ අනුව, දැනටමත් කල් පසු වූ ණය යටතට ගැනෙන වාරික 12 ක් හෝ ඊට වැඩි හිඟ හිටි ණය ශේෂ මත පදනම්ව පහත සඳහන් ප්‍රතිශතයන් යටතේ ගිණුම්වල අඩමාන ණය වෙන් කිරීමට කටයුතු කරමි. | ණයගැති ශේෂ විශ්ලේෂණයන් අනුව අඩමාන ණය වෙන්කිරීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම්හි ඇතුළත් රු. මිලියන 6.64 ක සමුච්චිත අරමුදල තුළ 2017 වර්ෂයේදී රේඛිය අමාත්‍යාංශයෙන් ලද රු. මිලියන 2.35 ක මෝටර් රථයක වටිනාකම ඇතුළත් කර තිබූ අතර එම මෝටර් රථයේ වටිනාකම රජයේ ප්‍රදානයක් ලෙස ගිණුම්ගතකර වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබී ඇති මෝටර් රථයේ වටිනාකම රජයේ ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කර ඇති අතර, එම ශේෂය වාර්ෂිකව කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) වර්ෂයකට වැඩි කාලයක් පවතින ශේෂයක් වූ ලුනාව නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලද රු. මිලියන 751.11 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි භාණ්ඩාගාර ප්‍රදාන යටතේ ගිණුම් ගත නොකර ජංගම වගකීම් යටතේ විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා හිමිකම් සහ සංචිත එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි භාණ්ඩාගාර ප්‍රදාන යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | භාණ්ඩාගාර ප්‍රදාන නිසි පරිදි ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලුනාව නිවාස ව්‍යාපෘතියේ නිවාසවලින් නොවිකිණී ඉතිරි වූ නිවාස ඒකක ප්‍රමාණය 181ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල නිවාස තොගය ලෙස ඒකක 180 ක් දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.මිලියන 3.64 කින් ඌන ගණනය වී තිබුණි. එසේම විකුණන ලද නිවාස 175 ට අදාලව හඳුනාගත යුතු ආදායමින් ලද හා නැවත ගෙවිය යුතු භාණ්ඩාගාර ප්‍රතිපාදන අඩුකළ පසු වෙනස වන රු.මිලියන 150.06 ක් අධිකාරියේ ආදායම ලෙස හඳුනා ගැනීමෙන් තොරව ලද රු.මිලියන 766.35 ක මුළු මුදලම ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අදායම රු.මිලියන 616.29 කින් අධිගණනය වී තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ මුදල් ගෙවා මිලදී ගත් නිවසක් අදාළ නිවාසලාභියා විසින් නැවත අධිකාරියට භාරදී ඇත. එම නිවාසය නැවත තොගයට එකතු කිරීම මගහැර ඇත. ඒ අනුව, ගිණුම්වල සිදුවී ඇති අධි ගණනයවීම්/ ඌණ ගණනයවීම් නිවැරදි කිරීමට කටයුතු කරමි. මෙම ව්‍යාපෘතිය සඳහා මහ භාණ්ඩාගාරය විසින් සපයන ලද ප්‍රතිපාදනය, රු.මිලි.1392.34 කි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ දී මූලික කැබිනට් තීරණයට අනුව ලබාදෙන ප්‍රතිපාදන නැවත භාණ්ඩාගාරය වෙත එවිය යුතු බවට සඳහන් කර නොමැත.<br>දෙවනුව 2020 වසරේ දී භාණ්ඩාගාර නීරීක්ෂණ යටතේ මෙම ව්‍යාපෘතියට ලබාදුන් ප්‍රතිපාදන නැවත ගෙවිය යුතු බවට නිරීක්ෂණයක් ලබාදී ඇත.<br>මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් ඉදිරියේදී ලබාදෙන උපදෙස් අනුව තවදුරටත් අවශ්‍ය තීරණ අධිකාරිය විසින් ගැනීමට කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.5 අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී නොතිබුණි. | 2008 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000ක් විය යුතු වුවද, මෙතෙක් අධිකාරිය වෙත කිසිදු ප්‍රාග්ධනයක් ලබා දී නොමැත.<br>ඒ අනුව, අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම සඳහා දැනට අප සතුව තිබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන මත එකතු කරන ලද ආදායම් නීත්‍යානුකූලව ස්ථාපිත කරන ලද නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදල තුලට බැර කර ඇති අතර, එම මුදල නිදන් අරමුදලක් ලෙස පවත්වාගෙන යන අතර, එහි බැංකු පොළිය පමණක් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දැනට භාවිතා කරනු ලැබේ. | රජයේ ප්‍රාග්ධන දායකය අධිකාරිය වෙත ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ)2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (1) (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද, 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. එම තීරණය ගන්නා ලද අවස්ථාව වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබු නමුත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට ලබා නොදුන් | නාගරික සංවර්ධන අධිකාරිය විසින් අප වෙත ලැබිය යුතු රු.මිලි.207.33 ක සේවා ගාස්තු මුදල ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ආයතන දෙක අතර, සාකච්ඡා පවත්වන ලද අතර, එහිදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය වූයේ විගණකාධිපතිවරයාගේ නිර්දේශ මත එම මුදල නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ද නැද්ද යන්න තීරණය කල යුතු බවත් එම අවස්ථාවට සහභාගී වූ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය එම තීරණය සමග ඔවුන්ගේ එකඟතාවය ද පල කරන ලදී. | පනතට අනුව එකතු කරන ලද ආදායම මෙම අධිකාරියට ලැබිය යුතු අතර මෙම ආයතන දෙකම එකම අමාත්‍යාංශයක් යටතේ ඇති බැවින් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. තවද, පනත පාර්ලිමේන්තුව වෙතින් සංශෝධනය සිදු කිරීමෙන් තොරව අමාත්‍ය මණ්ඩල තීරණයකින් සිදුකර ඇත. |

රු. මිලියන 207.33 ක සේවා ගාස්තු මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබා ගැනීමට අපොහොසත්ව තිබුණි.

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිවාස ව්‍යාපෘති 02 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති කුලී ආදායම රු.75,462,935 කින් වසර 1- 2ත් අතර කාලයක සිට අයවිය යුතු කුලී ආදායම රු. 12,079,528 ක් ද, වසර 2-5 ත් අතර කාලයක සිට අයවිය යුතු ශේෂය රු.34,769,303 ක් ද, වසර 5 ඉක්මවූ කාලයක සිට අයවිය යුතුව පැවති ශේෂය රු.16,384,576 ක් ද විය. | අක්‍රීය ණය සඳහා නීතිමය කටයුතු සිදු කිරීමටත් අනෙකුත් හිඟ මුදල් අයකිරීමටත් කටයුතු කරනු ලැබේ. | අයකර ගත යුතු නිවාස කුලී සහ ණය වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) නිවාස ව්‍යාපෘති 05 කට සහ සහනදායී ණය යෝජනා ක්‍රම 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය වාරික මුදල රු.130,973,939 ක් වූ අතර එයින් වසර 1- 2ත් අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු.23,162,568 ක් ද, වසර 2-5 ත් අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු.50,610,420 ක් ද, වසර 5 ට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවති ශේෂය රු.35,166,939ක් ද විය. | අක්‍රීය ණය සඳහා නීතිමය කටයුතු සිදු කිරීමටත් අනෙකුත් හිඟ මුදල් අයකිරීමටත් කටයුතු කරනු ලැබේ. දිගුකාලීනව හිඟ ණය වාරික ඇති ප්‍රතිලාභීන් සමඟ නව ගිවිසුම් අත්සන් කර ණය ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | අයකර ගත යුතු නිවාස කුලී සහ ණය වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සේවය අත්හිටවූ සහ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අය විය යුතු ආපදා ණය ශේෂය තුළ පැවති රු.313,952 ක ශේෂයෙන් රු.171,626 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | අධිකාරියේ ඉවත් වූ සේවකයන්ගෙන් අයකර ගත යුතු ආපදා ණය හිඟ මුදල හා නිවාස ණය හිඟ මුදල අයකර ගැනිම සඳහා එම ඉවත් වූ සේවකයන්ගෙන් කිහිපදෙනෙකු වෙත එන්තරවාසි යොමු කර ඇති අතර, දැනට සේවයේ නියුතු ඇප අත්සන් කර ඇති අයගේ වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇත. මෙහි එක් සේවකයෙකු පමණක් ඔහුට වැටුප නොගෙවූ කාලයට හිඟ වූ රු.85,974.13ක මුදල 2022 ජුලී මස සිට මාසික වාරික 18කින් වැටුපෙන් අඩු කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | නිලධාරින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෙත්සිරිපායේ පිහිටි කාර්යාල පරිශ්‍රය සඳහා ගෙවීම් අත්හිටුවා තිබූ නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු කාර්යාල කුලිය ඉකුත් වර්ෂයේ සිට නැවත ගෙවීම් කිරීම ආරම්භ කර තිබුණද 2016 වසර සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හිඟ හිටි කාර්යාල කුලිය රු.මිලියන 27.39 ක් විය. | රු.මිලි.27.39 ක ශේෂයෙන් රු.මිලි.12.64 ක මුදලක් 2021 වර්ෂය තුළ වියදමක් වන අතර, මේ වන විට රු.මිලි.12.64 ක මුදලක් ගෙවා දැමීමට කටයුතු කර ඇත. ඒ අනුව, රු.මිලි.14.74ක මුදල කොටස් වශයෙන් ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු කාර්යාල කුලී කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) (i) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත | නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 13 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. එසේම පනතේ 10 වන වගන්තිය අනුව අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වන විට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි. | ජාතික ප්‍රතිපත්තිය සකස් කිරිම සඳහා 2017 වර්ෂයේ සිට සභාපතිවරයෙකු ඇතුලත් සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කර තිබුණද ජාතික ප්‍රතිපත්තිය සකස් කිරිම සඳහා ගත් උත්සහයන් අසාර්ථක විය. නව උපදේශක කමිටුවක් පිහිටුවන ලද අතර එම උපදේශක කමිටුව මඟින් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරිම ආරම්භ කරන ලදි.<br>2022 වර්ෂයේ අග වන විට කෙටුම්පත් ප්‍රතිපත්තයක් සකස් කිරිමට උපදේශක කමිටුව අපේක්ෂා කරයි. පෙර වර්ෂයන් වලදී ද දේපළ බැහැර කිරීමේ ක්‍රමවේදය, උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කර අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු කෙරුණු අතර අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී උපදේශක කමිටුවේ උපදෙස් ලබා ගැනීම සිදු කෙරිණි. | සංස්ථා පනතේ අරමුණුවලට අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)1971 අංක 38 දරන මුදල් පනත 11 (ආ) වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පත්වල රු. මිලියන 1,195 ක් ආයෝජනය කර තිබුණි. | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව එම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදලක් ඇති කර මුදල් රැස්කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලිඛිත අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව, එම අරමුදල ජංගම ගිණුම තුළ පවත්වාගෙන යෑමෙන් සිදුවන මූල්‍ය අලාභය මග හරවා ගැනීම සඳහා ඉහළ පොළී අනුපාතිකයන් යටතේ රාජ්‍ය බැංකු තුළ ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගැනීමට කටයුතු කර ඇත. | මුදල් පනතේ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ. 261 (2) | චෙක්පත් මගින් ගෙවීම් සිදුකරන අවස්ථාවල චෙක්පතේ අංකය අදාළ වවුචරයේ මෙන්ම මුදල් පොතේ නියමිත සටහන ඉදිරියේද සටහන් කළ යුතු නමුත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ අගොස්තු මාසවලට අදාළ පුනරාවර්ථන ගෙවීම් අවස්ථා 152 කදී රු.31,088,815 කට අදාළ වවුචර්වල චෙක්පත් අංක සඳහන් කර නොතිබුණි. | චෙක්පත් අංකය වවුචරයේ මෙන්ම මුදල් පොතේ ද සටහන් කිරීමට කටයුතු කරන අතර, මගහැරීම් වළක්වා ගැනීමට දැනටමත් කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ. 262 (2) | වරක් ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ වවුචර්, නැවත වරක් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් වීමේ අවධානම වැළැක්වීම සඳහා ගෙවන ලද සියලුම වවුචර්වලත් ඒවා තහවුරු කරන ලියවිලි වලත් "ගෙවන ලදි" මුද්‍රාව යෙදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කළ රු.2,240,763 ක් වටිනා වුවවර්පත් 04 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවීය. | "ගෙවන ලදි" මුද්‍රාව සියලුම ගෙවීම් වවුචර් තහවුරු කරන ලියවිලි මග හැරීමකින් තොරව යෙදීමට දැනටමත් කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මු.රෙ. 262 (3) | ගෙවීම් කෙරෙන්නේ චෙක්පතකින් නම් අදාළ චෙක්පතට අත්සන් තබන අවස්ථාවේ ගෙවන නිලධාරීයා විසින් සිය අත්සන හෝ කෙටි අත්සන හෝ අදාළ ගෙවීම් වවුචරයෙහි සහ තහවුරු කෙරෙන ලියවිලිවලත් යෙදිය යුතු වුවත් අධිකාරිය විසින් අවස්ථා 44 කදී ගෙවීම් කළ රු.5,297,906 කට අදාළ වවුචර්පත් මත ගෙවන නිලධාරියා විසින් තම අත්සන හෝ කෙටිසන තබා නොතිබුණි. | ගෙවීම් වවුචර්වලත් තහවුරු ලියවිලිවලත් මග හැරීමකින් තොරව අත්සන් යෙදීමට දැනටමත් කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iv) මු.රෙ. 371 (2) (ආ) | • සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 13 කදී නිලධාරීන් 12 දෙනෙකු වෙත ලබා දී තිබූ රු. 3,000 ත් රු. 60,000 ත් අතර පරාසයක වූ රු.218,000 ක විශේෂ අත්තිකාරම් මුදල් අදාළ කාර්යය සඳහා වියදම් කිරීමකින් තොරව දින 01 සිට දින 30 ක කාලයක් අත රදවාගැනීමෙන් පසුව නිරවුල් කර තිබුණි. | • අධිකාරියේ මානව සංවර්ධන වැඩසටහන් බොහෝවිට විශේෂ අත්තිකාරම් මුදල් ලබාගැනීම තුළින් ක්‍රියාත්මක කෙරෙන අතර, අදාළ අංශ ප්‍රධානීන්ගේ නිර්දේශ හා අධීක්ෂණය යටතේ එම වැඩසටහන් සිදුකරයි.<br><br>ඉටු කිරීමට නිශ්චිත කෙරෙන වැඩසටහන් සඳහාම අත්තිකාරම් ලබාගැනීමටත් අදාළ කාර්ය ඉටුනොවන අවස්ථාවකදී වහාම පියවීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | අත්තිකාරම් නියමිත කාලය තුළ පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | • කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමට කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයේදි මුදල් රෙගුලාසි වලට පටහැනි අවස්ථා 07 කදී නිලධාරීන්ට රු.104,000 ත් රු.120,000 ත් අතර පරාසයක එකතුව රු.752,000 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | • සාමාන්‍යයෙන් රු.100,000/- දක්වා පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදෙන අතර, විශේෂිත අවස්ථා කිහිපයකදී පමණක් එනම්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනෙකුත් අන්‍යාකාරව පැවැත්වෙන රැස්වීම්වලදී එකවර ගෙවිය යුතු දීමනා ගෙවා දැමීමේ දී පමණක් රු.100,000/- කට වැඩි අත්තිකාරම් මුදල් ගෙවීම් සඳහා අනුමත කරනු ලබයි. | මූල්‍ය සීමා ඉක්මවීමට අවශ්‍ය අවස්ථාවලදී ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | • කිසියම් නිලධාරියෙකුට ලබා දෙන තත්කාර්ය අතුරු අග්‍රිම මුදල් එම කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළ යුතු වුවත් අධිකාරියේ නිලධාරින් වෙත අවස්ථා 34 කදී ලබා දුන් රු.788,170 ක අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 35 ත් 263 ත් අතර කාලයක් ගත කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | • අදාළ කාර්ය නිමවූ විගසම අතුරු අග්‍රිම පියවීමට සියලු ම අංශ වෙත උපදෙස් ලබාදී ඇති අතර, නියමිත දිනට පෙර පියවීම් සිදුකිරීම කෙරේ දිගින් දිගටම අවධානය යොමු කෙරේ. අත්තිකාරම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛන ප්‍රකාරව ක්‍රියා නොකරන අයට එරෙහිව විනයානුකූලව ක්‍රියාකරන ලෙසට අංශ ප්‍රධානින් වෙත උපදෙස් ලබාදී ඇත. | අත්තිකාරම් නියමිත කාලය තුළ පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදය 13.1.2 සහ 13.4 ඡේදය | යම් කිසි තනතුරක වැඩ බැලීම සඳහා එම තනතුරු දැරීමට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සෑම අතින්ම සුදුසුකම් තිබෙන නිලධාරීයෙකු පත්කළ යුතු වුවද අධිකාරිය විසින් ඊට පටහැනිව 2021 දෙසැම්බර් 29 දින විධායක මට්ටමේ වැඩ බැලීමේ තනතුරු 3 ක් සඳහා නියමිත සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරීන් පත්කර තිබුණි. | අධිකාරියේ විධායක මට්ටමේ පුරප්පාඩු වූ තනතුරු 03 ක කටයුතු අකර්මන්‍ය වීම හා නව බඳවා ගැනීම් අත්හිටුවීම හේතුවෙන් අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණ මඟින් ඉහළම සුදුසුකම් සපුරාලන ලද නිලධාරීන් 03 ක් වැඩ බැලීමේ පදනම මත තනතුරු වල යොදවන ලදී. | පුරප්පාඩු පිරවමේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.784,619,371 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,170,456 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 782,448,915 ක ප්‍රගතියක් නිරීක්ෂණය විය. ලුනාව නිවාස සංවර්ධන වැඩසටහනෙහි නිවාස විකිණීමෙන් ලද මුළු වටිනාකම ම අධිකාරියේ ආදායමක් වශයෙන් ගිණුම්ගත කිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මහා භාණ්ඩාගාර පුනරාවර්ථන ප්‍රදාන රු. මිලියන 26 කින් හෙවත් සියයට 20 කින් වැඩිවී තිබුණු අතර මානව සංවර්ධන වැඩ සටහන වෙනුවෙන් ලද මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 16 කින් හෙවත් සියයට 145 කින් වැඩි වී තිබුණි. එසේම අධිකාරියේ වැටුප්, අතිකාල හා වෙනත් දීමනා රු. මිලියන 10 කින් හෙවත් සියයට 15 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

-------------------------

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ අතිරික්ත අනුපාතය සියයට 77 කින් වැඩි වී තිබුණු අතර ලුනාව නිවාස සංවර්ධන ව්‍යාපෘතියෙහි නිවාස විකිණීමෙන් ලද ආදායම් රු. මිලියන 766 ක මුළු වටිනාකම ම ආදායම ලෙස දැක්වීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරියෙහි 0072703594 දරන බැංකු ජංගම ගිණුමට නිවාස අයදුම්කරුවන්ගෙන් හා මිලදී ගත් අයගෙන් වාරික ලෙස ලැබෙන ඍජු තැන්පතු හඳුනාගැනීමට අධිකාරිය විසින් නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට හඳුනා නොගත් ශේෂය රු.16,279,125 ක් විය. මෙයින් රු.5,706,230 ක් 2019 ජුනි සිට 2021 නොවැම්බර් 30 දක්වා කාලයට අදාළ වූ අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබුණි. | අධිකාරියට අයවිය යුතු මුදල් 0072703594 දරණ ගිණුමට ඍජු ක්‍රමයට තැන්පත් කිරීමට අදාළ ණයලාභීන් දැනුවත් කළ අතර, මෙම ක්‍රමවේදය සඳහා ඍජුව තැන්පත් කරන ප්‍රතිලාභීන් වෙත අදාළ වට්ස්ඇප් (Whats App) අංකයක් හඳුන්වා දුන් අතර, මේ සඳහා මුදල් තැන්පතු පත්‍රිකාවේ ඡායා රූපයක් අදාළ අංකය සඳහා එවන ලෙස දැනුවත් කර ඇත. ඒ අනුව, අදාළ වට්ස්ඇප් (Whats App) අංකය වෙත ලැබෙන තැන්පතු පත් හා බැංකු විස්තර ප්‍රකාශයේ ශේෂයන් සමග ගලපා අදාළ ගනුදෙනු හඳුනාගැනීම සිදුකරනු ලැබේ.<br><br>මේ වන විට රු.208,950/- ක ශේෂයක් හැර ඉතිරි මුදල් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | ඍජු තැන්පතු කඩිනමින් හඳුනාගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ඇති කළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් නිම කළ නිවාස යෝජනාක්‍රම 03 ක හා ඉදිකරමින් පවතින නිවාස යෝජනාක්‍රම එකක පවතින නිවාස ඒකක 512 කට අදාල හෙක්ටයාර 2.21 ක ඉඩම් අදාල ආයතනවලින් පවරා ගැනීම අවසන් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් ඉදිකර අයිතිය භාර දී ඇති නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය. | රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉදිරි කටයුතු කඩිනමින් සම්බන්ධීකරණය කරගනිමින් මෙම ඉඩම් කොටස් අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) තලවකැලේ නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට අධිකාරිය විසින් 2019 වර්ෂයේ ලබාදී තිබු නිවාස 15 ක් | තෙවන පාර්ශවයක් වෙත බැහැර කර ඇති බවට හඳුනාගනු ලැබු ප්‍රතිලාභීන් පදිංචි නොවුන හොත් ඉඩමෙන් සහ නිවසින් | අනවසරයෙන් තෙවන පාර්ශවයක් වෙත නිවාස බැහැර කර ඇති අයට |

| | | |
|---|---|---|
| අධිකාරියේ අනුමැතියකින් තොරව වෙනත් පුද්ගලයින්ට 2019 වර්ෂයේදී විකුණා හෝ කුලියට ලබාදී තිබූ අතර එම ප්‍රතිලාභීන්ට එරෙහිව හා 2019 වර්ෂයේ සිට නිවාස 10 ක පදිංචි අනවසර පුද්ගලයින් ඉවත් කිරීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෙන නොතිබුණි | නෙරපීම සඳහා නිත්‍යාණුකූල කටයුතු කරනු ලබන බවට 2021.11.08 දිනැතිව ලිඛිතව දැනුම් දී ඇති අතර ඉදිරියේදී අවශ්‍ය නෛතික කටයුතු සිදු කිරීම සඳහා අදාළ අංශයන්ට උපදෙස් ලබා දී ඇත.<br><br>අනවසර පදිංචිකරුවන් 15 දෙනෙකු හඳුනාගෙන ඇති අතර ඉන් දෙදෙනෙකු අධිකාරිය සමග ගිවිසුම් අත්සන් නොකර කුය ලේඛන සකස් කර අදාල නිවාස අනවසරයෙන් බැහැර කර ඇති බවද හෙළිවී ඇති අතර ඒ සඳහා ද නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) හලාවත නිවාස ව්‍යාපෘතියේ කාණු පද්ධතිය සැකසීමට 2015 වර්ෂයේදී රු.මිලියන 2.86 ක් අධිකාරියට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටු කර නොතිබුණි. | වරින් වර ඇති වූ මිල ගණන් ඉහල යාම් හේතුවෙන් කිහිපවිටක්ම ඇස්තමේන්තුගත පිරිවැය සංශෝධනය වූ මෙම ව්‍යාපෘතියට අදාලව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව දේශීය තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ලංසු කැඳවීම 2022 අප්‍රේල් මස ආරම්භ කල ද වත්මන් ඉහල උද්ධමනකාරී ආර්ථික තත්වය යටතේ කිසිඳු කොන්ත්‍රාත්කරුවකු මේ වන තුරු ඉදිරිපත් වී නොමැත. එබැවින් නුදුරේදීම නැවතත් ලංසු කැඳවීමට අපේක්ෂා කරන අතර පවතින රුපියල අවප්‍රමාණය වීමේ හේතුව මත කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම ගැටලුකාරී තත්ත්වයක් බව සඳහන් කළ යුතුය. | සැලසුම් කළ කාලය ඇතුලත අදාල ව්‍යාපෘති කටයුතු නිමකළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය විසින් ධීවර ජනතාව වෙනුවෙන් ඉදිකළ අඟුලාන නිවාස සංකීර්ණයේ පැවති නිවාස 288 කින් රු.මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක් මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් 2016 සැප්තැම්බර් 26 සිට 2019 පෙබරවාරි 12 අතර කාලය තුළ සිනමා ශිල්පීන්ට හා ක්‍රීඩකයින්ට භුක්තිය ලබාදී තිබුණ නමුත් පසුව එනම් 2019 සැප්තැම්බර් 18 දිනැති | මෙහි සිනමා ශිල්පීන්ට සහ ක්‍රීඩකයන්ට ලබාදී ඇති නිවාස ඒකක 53ක් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පැන නැගී ඇත. ඊට හේතුව වන්නේ අදාළ කැබිනට් තීරණයට අනුව ඔවුන්ගෙන් සාධාරණ මුදලක් අයකර ගත යුතු බවට භාණ්ඩාගාර නිරීක්ෂණ මගින් දක්වා ඇති නමුත් එවකට සිටි විෂය භාර ඇමතිවරයා විසින් නිදහස් ප්‍රදානයක් ලෙස ඔහු විසින් | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධිකාරිය වෙත ලැබිය යුතු මුදල් ආදාළ වගකිව යුතු පාර්ශව වලින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| හා අංක අමප/අංක/19/2761/122/085 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් සාධාරන මුදලක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු මුදලක් අධිකාරිය අයකරගෙන නොතිබුණි. එම නිවාස සඳහා මුදලක් අයකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලබා ගැනීමට පෙර නිවාස ප්‍රදාන පත්‍රයකින් ප්‍රදානය කර තිබීම මේ සඳහා හේතුවී තිබුණි. | ම අත්සන් තබා ප්‍රදාන පත්‍රයක් මේ අයට ලබාදී ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අප විසින් නීතිපති උපදෙස් ඉල්ලා ඇති නමුත් මෙතෙක් එම උපදෙස් ලැබී නොමැත. නීතිපති උපදෙස් ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.<br>ප්‍රතිලාභීන් සඳහා අමාත්‍යවරයාගේ අත්සනින් ලැබී ඇති ප්‍රදාන පත්‍රය හේතුවෙන් එක් අයෙකු හැර අනෙක් සියලු දෙනා මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. | |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නිවාස ව්‍යාපෘති 07 ක් සහ විසිරි නිවාස ණය ලබාදීම වෙනුවෙන් රු.මිලියන 716.11 ක් අධිකාරිය වෙත ලබා දී තිබුණි. මෙම මුදල් විවිධ ව්‍යාපෘති හරහා අඩු ආදායම්ලාභීන් වෙත ලබා දී තිබූ අතර ලබාදුන් නිවාසවල වටිනාකම වාරිකව සහ විසිරි නිවාස ණය වාරික වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභීන්ගෙන් අයකර ගත් රු.මිලියන 10.82 ක් 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතේ 16 වගන්තිය පරිදි වූ අධිකාරියේ අරමුදලකට බැර කර නොතිබුණි. | ණය අයකර ගැනීම් තුළින් ලැබෙන ආදායම් අධිකාරියේ අරමුදලට බැරවන අතර, එම අරමුදල් ස්ථාවර වත්කම් සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණක් යොදා ගන්නා අතර, පුනරාවර්ථන වියදම් සඳහා භාවිතා නොකරයි. | පනතේ විධිවිධාන ප්‍රකාර වූ අරමුදලක් ඇති කළ යුතුය. |
| (ඇ) සීමාසහිත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම අධිකාරියට පවරා ගැනීමේදි සිදුව තිබූ මූල්‍ය වංචාවට අදාළව නීතිපති විසින් 2021 ඔක්තෝබර් 28 දින ලබාදුන් උපදෙස් අනුව අලාභය සම්බන්ධව අදාළ පුද්ගනයින්ට එරෙහිව නඩු කටයුතු පැවරිය හැකිද යන්න සලකා බැලීම සඳහා මුදල් රෙගුලාසි 103 (පරිච්ඡේද II) යටතේ අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඒ සම්බන්ධව වගකිව යුතු පුද්ගලයින් හා රජයට සිදුවී ඇති අලාභය නිවැරදිව ගණනය කළ යුතුව ඇති බව සඳහන් වුවද රේඛීය අමාත්‍යාංශය ඒ පිළිබඳ ඉදිරි | කඩුවෙල දිසා අධිකරණයේ නඩු අංක 543/එම් ආර් නඩුව නැවත අභියාචනය කිරීම පිළිබඳ නීතිපති උපදෙස් අනුව ශ්‍රී ලංකා ජනරජයට වූ අලාභය සම්බන්ධව මුදල් රෙගුලාසි 103 (පරිච්ඡේද II) යටතේ අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් පියවර ගැනීමට 2022.03.30 වන දින මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර, මෙතෙක් ඒ පිළිබඳ කිසිදු උපදෙසක් ලැබී නැත. | රේඛීය අමාත්‍යාංශයේ මැදිහත් වීම මත මෙය නිරාකරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු 2022 ජුනි වන විටත් සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | හම්බන්තොට සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ (Sanitation Improvement Programme) වැඩසටහන වෙනුවෙන් ඉකුත් වර්ෂවලදී අධිකාරියට මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් වලින් ඉතිරි රු.4,514,970 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි. | මේ වන විට මෙම ව්‍යාපෘතියට අදාල සියලු බිල්පත් ගෙවීම් කර සියලු බාහිර වගකීම් හා බැඳීම් නිමා කර ඇති අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) හරහා ලැබුණු ඉතිරි රු. 4,514,970.00 ක මූල්‍යමය ප්‍රතිපාදන අධිකාරිය විසින් සිදු කිරීමට යෝජිත සනීපාරක්ශක හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා යෙදවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022.06.16 දිනැති 05/2022/03 අංක දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව හලාවත නරියාගොඩැල්ලවත්ත හා තලවාකැලේ නිවාස ව්‍යාපෘතිය වැනි නිවාස ව්‍යාපෘති වල යෝජිත සනීපාරක්ශක හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා 2022 වසර තුල යෙදවීමට සැලසුම් කර ඇත. | අදාළ මුදල් කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | මානව සංවර්ධන වැඩසටහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට රු.මිලියන 27 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණ අතර ඉන් රු.මිලියන 22.05ක් එනම් සියයට 82 ක් පමණක් අදාළ වැඩ සටහන සඳහා වැයකර තිබූ අතර එයින්ද රු.මිලියන 7.60 ක් හෙවත් සියයට 34 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල ඉන්ධන, නවාතැන්, ආහාරපාන ලබා ගැනීම වැනි පුනරාවර්ථන කටයුතු සඳහා වැය කර තිබුණි. ඒ අනුව මානව සංවර්ධන වැඩසටහන වෙනුවෙන් වැයකර තිබුණේ සියයට 66 ක් පමණක් වූ අතර, ලැබුණු රු.මිලියන 27 න් ඉතිරි රු. මිලියන 4.95 ක මුදල අධිකාරියේ අයභාර වියදම් වෙනුවෙන් වැයකර තිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි මානව සංවර්ධන වැඩසටහන් 2021 වර්ෂයේ ක්‍රියාත්මක නොවීම නිසා එම වසරේ ප්‍රතිපාදන ඉතිරි වී පවති. මෙම ප්‍රතිපාදන අයභාර වියදම් සඳහා වැයකර නොමැති අතර, ඉදිරි වර්ෂයේ මානව සංවර්ධන වැඩසටහන් සඳහා යොදා ගැනිමට නියමිතය. | මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන පුනරාවර්ථන වියදම් සඳහා යොදා නොගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සී.ස රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම (REEL) ඈවර කර ඉතිරි වත්කම් හා වගකීම් අධිකාරිය වෙත පවරාගෙන මාස 2 ක් ඇතුළත් ගණන් බේරා වසා දැමීමට අනුමැතිය ලබාදුන් අංක 14/1293/517/031 හා 2014 සැප්තැම්බර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සමාගමේ වගකීම් පියවීම සඳහා 2015 ඔක්තෝබර් 12 දිනැතිව අධිකාරිය වෙත ලද රු.මිලියන 19.02 ක මුදලින් හඳුනාගත් බාහිර පාර්ශවකරුවන් 24 දෙනෙකු වෙත ගෙවීම සඳහා 2015 ඔක්තෝබර් මස අධිකාරියේ බැංකු ගිණුමෙන් ලියන ලද රු. මිලියන 7.11 ක චෙක්පත් වසර 6 ක කාලයක සිට 2021 දෙසැම්බර් දක්වා එම පාර්ශවයන් වෙත ලබාදීමට කටයුතු නොකර, එම චෙක්පත් වටිනාකමින් රු.මිලියන 4.45 ක් නිවාස ව්‍යාපෘති 2 කට අදාළ නිවාස ප්‍රතිලාභීන් විසින් එම ව්‍යාපෘතිවල කළමනාකරණ සංස්ථා අරමුදලට ගෙවා තිබූ නමුත් අධිකාරිය විසින් වෙනත් කාර්යයන් සඳහා වියදම් කර තිබූ මුදල පියවීමටද ඉතිරි රු.මිලියන 2.66 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ආදායමක් ලෙසද ගිණුම්ගත කර තිබුණි. | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2019.01.03 දිනැති (PV5592 LIQURDATION) ලිපියේ දැනුම් දීමට අනුව රීල් සමාගම ගණන් බලා වසා දැමීමේ ක්‍රියාවලිය අවසන් කර ඇත. මෙම වගකීම් සඳහා හිමිකම් පෑමක් ද එම ක්‍රියාවලිය තුළ ඉදිරිපත් නොවී ඇත. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට අනුව නිවාස ව්‍යාපෘති දෙකට අදාළ ඡාය සහාධිපත්‍ය කළමනාකරණ සංස්ථා අරමුදල් වෙනුවෙන් එම ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, ඉතිරි මුදල් අධිකාරියේ අරමුදලට බැර කර ඇත. | බාහිර පාර්ශවයන් වෙත ගෙවීමට සුදානම් කර ඇති චෙක්පත් පිළිබඳව එම පාර්ශවයන් නිසිපරිදි දැනුවත් කළ යුතු අතර ඒ බව සනාථ කිරීමට හැකිවන ආකාරයට වාර්තා තබාගත යුතුය. |

## 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය සතු නිවාස යෝජනා ක්‍රම 03 ක පවතින නිවාස 16 ක් වසර 2 ත් වසර 5 ත් අතර කාලයක් භාවිතයට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් අධිකාරියට රැස්කර ගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණි. | “තුරුඉතුරුගම” හරිත ජනාවාසයේ පිහිටි සුධාරක තාක්ෂණයෙන් ඉදි කර ඇති නිවාස 06 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා වෙන් කර ඇති අතර, තලවකැලේ නිවාස යෝජනා ක්‍රමයේ ගිවිසුම් අත්සන් නොකළ නිවාස 07 හි ප්‍රතිලාභීන් ගිවිසුම් අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරමින් සිටී. ඉදිරියේදී ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ. අනුරාධපුර “තුරුඉතුරුගම” හරිත | අදාළ නිවාස කඩිනමින් බැහැර කිරීමට අදාළ පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ජනාවාසයේ බැහැර කළ යුතු නිවාස 02 හි අනවසරකරුවන් පදිංචි වීම නිසා අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ රජයේ ඉඩම් සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ නඩු පවරා ඇති අතර, නඩු කටයුතු අවසන් කිරීමෙන් පසු කඩිනමින් මෙම නිවාස 02 ක ද බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) නිසි සක්‍යතා අධ්‍යනයකින් තොරව මහනුවර මහයියාව ප්‍රදේශයේ අක්කර 12 ක භූමි ප්‍රදේශයක අඩු පහසුකම් සහිත නිවාස 1220 ක් වෙනුවෙන් ස්ථිර නිවාස ඉදිකිරීම සඳහා සැළසුම් කළ ව්‍යාපෘතිය සඳහා නායයෑම් අවදානම් රහිත භූමිය අක්කර 04 කට සීමා වීම නිසා අධිකාරිය විසින් ව්‍යාපෘති කටයුතු අත්හැර දමා තිබූ අතර ව්‍යාපෘතිය වෙනුවෙන් එතෙක් දරන ලද රු.1,855,411 ක වියදම නිෂ්කාර්ය වියදමක් වූ අතර එය අධිකාරියේ ලාභයට එරෙහිව කපා නොහැර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්වල දක්වා තිබුණි. | අදාළ භූමිය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණය මගින් මෙම භූමියේ අක්කර 12න් අක්කර 2ක් ම ඉදිකිරීම සඳහා නුසුදුසු බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ලබාදුන් වාර්තාව මගින් පෙන්වා දී ඇත.<br>කෙසේ වෙතත් යෝජිත පකිස්ථානු රජයේ ණය පහසුකම නොලැබීම මත රාජ්‍ය සහ පුද්ගලික හවුල්කාරීත්ව පදනම මත මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යන කිහිපයක් සිදුකරන ලදී.<br>ඒ අනුව, මෙම ව්‍යාපෘතිය PPP ක්‍රමවේදය යටතේ සිදුකිරීම සඳහා සුදුසු නොවන බවට තහවුරු වීම නිසා ව්‍යාපෘතිය නවතා දමන ලදී.<br>කෙසේ වෙතත් ශක්‍යතාවයක් නැති ව්‍යාපෘතියක් සඳහා කරන ලද මූලික වියදම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට මූල්‍යමය අලාභයක් සිදුකර ඇත. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම සක්‍යතා අධ්‍යයනයක් කළ යුතු අතර නිෂ්කාර්ය වියදම් නිසි අනුමැතීන් මත ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 14.19 ක් වූ අගුලාන සයුරපුර මහල් නිවාස සංකිර්ණයේ සුභසාධක ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කළ වැඩ වටිනාකම රු. මිලියන 5.85 ක්ව පැවතියදි කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය 2019 වර්ෂයේදි අත්හැර දමා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබූ වැඩ පූර්ව අත්තිකාරම් මුදලෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයවිය යුතුව පැවති රු. මිලියන 1.32 ක ශේෂය අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | මෙම හිඟ මුදල ලබා ගැනීම සඳහා වරින් වර ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) සමග සාකච්ඡා පවත්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස අංක NP/C/16/24 දරණ 2022.04.08 දිනැති ලිපිය මගින් උක්ත මුදල අප ආයතනයට ගෙවීමට ඔවුන්ගේ එකඟතාවය දක්වා ඇත.<br>ඒ අනුව, අපගේ 2022.05.17 දිනැති USDA/ENG/08/07 Fin III දරණ ලිපිය මගින් එම ගෙවීම සිදු කිරීමට ඔවුන් විසින් යෝජනා කරන ක්‍රමවේදය පිළිබඳව අප විසින් මේ වන විටත් විමසා ඇති අතර එම මුදල් තවදුරටත් ගෙවීම් පැහැර හරින්නේ නම් රේඛීය | අදාළ කාර්යයන් කඩිනමින් නිම කිරීමට හා අයවිය යුතු මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශයේ උපදෙස් මත අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | |

### 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 182 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය 135 ක් විය.ඒ අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 47 ක් වූ අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 02 ක් විය. | අනුමත කාර්ය මණ්ඩලය 182ක් වුනත් ස්ථිර කාර්ය මණ්ඩලය 153කි . තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ඉංජිනේරු අංශය සඳහා කොන්ත්‍රාත් පදනම මත 13 දෙනෙකු බඳවාගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇත. දැනට ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා සිදුකරන මූලික ඉංජිනේරුමය කටයුතු සඳහා අවශ්‍යම කරන නිලධාරීන් 04 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත මේ යටතේ බඳවාගෙන ඇත. ඉදිරියේ දී ව්‍යාපෘති සිදුවන ආකාරය අනුව ඉතිරි 09 දෙනා බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඒ අනුව කාර්ය මණ්ඩලය 153+13=166 ක් වේ. | විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව තථ්‍ය කාර්ය මණ්ඩලය 135 කි. අනුමත කාර්ය මණ්ඩල සංශෝධනයන් සිදුකර පුරප්පාඩු හා අතිරික්තතා රහිතව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක DMS/1523(Vol – 1) සහ 2019 මැයි 22 දිනැති ලිපිය මගින් අධිකාරියේ අනුමත තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය පැරණි ආකෘතියට අනුව සකස් කරන ලද්දක් බැවින් එය නව ආකෘතිය අනුව යාවත්කාලීන කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්, 2022 අප්‍රේල් වන විටත් අදාල පරිදි අනුමත බඳවාගැනීමේ පරිපාටියක් අධිකාරියට නොතිබුණි. | 2016 ආකෘතියට අනුව, යාවත් කාලීන කරන ලද බඳවාගැනීම් පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අප විසින් 2018 වසරේ සිට යොමු කරන ලද අතර, අවසන් වරට ගොනු අංක USDA/ADM/03/71 – 2021 යටතේ 2022.03.15 දිනද තවදුරටත් සංශෝධනය කරමින් රේඛීය අමාත්‍යාංශය හරහා අනුමැතියට යොමු කර ඇතත් මෙතෙක් අනුමැතිය ලබාදී නොමැත. | අදාළ තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට විධිමත්ව ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අවසන් වරට අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටියට අනුව සමාජ සංවර්ධන සහකාර තනතුර සඳහා අයදුම් කිරීමේදි සපුරාලිය යුතු සුදුසුකමක් වන ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පිරිනමනු ලබන වෘත්තිය සමාජ වැඩ පිළිබඳ පූර්ණ කාලීන වසර 2 ක ඩිප්ලෝමා පාඨමාලාව සමත් වි තිබිය | තනතුරු 12 සඳහා ඉල්ලුම් කරන ලද අපේක්ෂකයන් අතරින් සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව හිමි 03 දෙනෙක් අතරින් දෙදෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට පැමිණි අතර, ඔවුන් ලබාදෙන වැටුප සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවී එම තනතුරු ලබාගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව, එම සුදුසුකම හැර අනෙකුත් සියලු ම | අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. |

යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත බඳවා ගත් සමාජ සංවර්ධන සහකාරවරු 12 දෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කරන විටද එම මූලික සුදුසුකම සපුරා නොතිබුණු අතර බඳවා ගැනීමේ පරිපාටියේ නියමයන්ට පටහැනිව ඉදිරියේ එම මූලික සුදුසුකම සම්පූර්ණ කිරීමේ එකඟතාවය මත ඔවුන් එම තනතුර සඳහා බඳවා ගෙන තිබුණි.

සුදුසුකම් සපුරාලමින් සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළ ම ලකුණු ලබාගත් 10 දෙනෙකු සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව වසර 02ක් ඇතුලත සම්පූර්ණ කර දීමේ එකඟතාවය මත පත්වීම් ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

කෙසේ වෙතත් 2016 ආකෘතියට අනුව සකස් කරන ලද සංශෝධිත බඳවාගැනීමේ පටිපාටියෙන් මෙම තනතුර සඳහා සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාවක අවශ්‍යතාවය ඉවත් කර ඇති අතර, එම පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සාකච්ඡා මට්ටමේ දී අනුමත කර ඇතත් මෙතෙක් ලිඛිත අනුමැතිය අප වෙත එවා නොමැත.

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | | |
| (අ) නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යනය කටයුතු පැවැත්වීම. | අප ආයතනයේ සමාජ සජීවිකරණ අංශය මගින් සිදුකරන ව්‍යාපෘති වල තොරතුරු සංයුත්ත සැලැස්මට ඇතුලත් කර සංයුත්ත සැලැස්ම යාවත්කාලින කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ. | අධිකාරියේ අරමුණුවලට ලඟාවිය හැකි පරිදි කාර්යයන් ඇතුළත් කර සංයුක්ත සැලැස්ම සැකසිය යුතුය. |
| (ආ)ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | නාගරික නිවාස සංචිතය සඳහා ප්‍රමිතිගත නිවාස එක් කිරීම අරමුණු කරගත් " නිවාස ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේන් භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙනුවට රාජ්‍ය බැංකු හරහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙසට නිර්දේශ ලබා දී ඇත. ඒ පිළිබඳ තොරතුරු සංයුත්ත සැලැස්මට ඇතුලත් කර සංයුක්ත සැලැස්ම යාවත්කාලින කිරීමට කටයුතු කෙරේ. | අධිකාරියේ අරමුණුවලට ලඟාවිය හැකි පරිදි කාර්යයන් ඇතුළත් කර සංයුක්ත සැලැස්ම සැකසිය යුතුය. |

## 4.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 අංක 36 දරණ අධිකාරි පනත අනුව නාගරික අඩු ආදායම් ලාභී ප්‍රජාවගේ භෞතික , සමාජ හා ආර්ථික තත්ත්වය නගා සිටුවීම අරමුණු කර ගනිමින් භෞතික සංවර්ධන ව්‍යාපෘති 07 ක් ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021 වර්ෂයට ක්‍රියාත්මක කළ යුතු වුවද ලූනාව නිවාස ව්‍යාපෘතියේ නිම කිරීමේ අදියරේ කාර්යයන්ට අමතරව සමාලෝචිත වර්ෂයේදි කිසිදු භෞතික සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණි. එසේම, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 6,619.56 ක් වූ මධ්‍ය ආදායම් ලාභීන් සඳහා වූ නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි. | අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ භෞතික, සමාජ හා ආර්ථික තත්ත්වය නඟා සිටුවීම අරමුණු කර ගනිමින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ලූනාව නිවාස ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන ලදී. එමෙන්ම 2021 වර්ෂයේ අභ්‍යන්තර ඉපයීම් වලින් නිමකිරීමට සැලසුම් කර තිබූ භෞතික සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික සංකල්පීය සැලසුම් සඳහා අනුමැතීන් ලබා ගැනීමට ඒ අනුව කටයුතු කරන ලදී. රු.මිලියන 6,619.56 ක මූල්‍ය ඇස්තමේන්තුව සහිත මධ්‍ය ආදායම්ලාභීන් සඳහා වූ ව්‍යාපෘතියේ මූලික කටයුතු 2021 වර්ෂය තුළ සිදු කිරීමට හැකි විය. | ක්‍රියාකාරී සැලැසුම යථාර්තවාදී ලෙස පිළියෙල කර අදාළ කාර්යයන් සැලැසුමට අනුව ඉටු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදි භාණ්ඩාගාර ප්‍රදාන මත ඉටුකළ යුතු ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැලසුම තුළ ඇතුළත් කර තිබුණු අතර අධිකාරියේ ඉපයීම් මත ඉටුකරන ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ අනෙකුත් භෞතික ව්‍යාපෘතීන්ගෙන් සිංහපුර හා සහස්පුර නිවාස ව්‍යාපෘතීන්හි අලුත් වැඩියා කිරීම් කටයුතු අධිකාරියේ අභ්‍යන්තර ඉපයීම් මඟින් සිදු කිරීමට සැලසුම් කරන ලදී. තව ද ලූනාව හා නාවලපිටිය නිවාස ව්‍යාපෘතියේ අභ්‍යන්තර ඉපයීම් මඟින් සිදු කරන ලද අතර මෙම ක්‍රියාකාරකම් 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලදී. | පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘතිවල අළුත්වැඩියාවන් හා ඉදිකිරීම් ද භාණ්ඩාගාර ප්‍රදාන මත ඉටුකළ යුතු ක්‍රියාකාරකම් වන අතර අධිකාරියේ ඉපයීම් මත ඉටුකරන ක්‍රියාකාරකම් ද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව පහත සඳහන් කරුණු ඇතුළත් කර අධිකාරිය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | | |
| (I) යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා පුළුල් කිරීම්, ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුළත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම | යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා පුළුල් කිරිම් ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා ඇතුලත් කිරිමට කටයුතු කරනු ලැබේ. | වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත සියළු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (II) මානව සම්පත් සංවර්ධන සැලැස්ම | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම ඇතුලත් කිරිමට කටයුතු කරනු ලැබේ. | වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත සියළු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අනුමත කාර්ය මණ්ඩලය තුළ විගණන අංශය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර එය මධ්‍යම කළමණාකරන මට්ටමේ (MM) තනතුරක් ලෙස තවදුරටත් පවත්වාගෙන ගොස් තිබුණි. එසේම මෙම අංශයට විගණන නිලධාරීන් බඳවාගැනීමකින් තොරව කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. | අධිකාරියේ අභ්‍යන්තර විගණක තනතුරක් (HM -1-1) ඇති කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී. එම අනුමැතියට අනුව රේඛීය අමාත්‍යාංශය හරහා අදාළ ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. | අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ කොටසක් ලෙස අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත විගණන සැලැස්මෙහි ඇතුළත් විගණන වැඩසටහන් 14 කින් වැඩ සටහන් 3 කට අදාළ කාර්යයන් පමණක් සිදුකර තිබුණි. | ඉදිරි වර්ෂයට අදාළ විගණන සැලැස්මෙහි ඇතුලත් වැඩසටහන්වලට අදාළ කාර්යන් ඉටු කිරීමට කටයුතු කරමි. | විගණන සැලැසුමට අනුව අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.4 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය විසින් සඵලදායී පාලන උපක්‍රමයක් ලෙස අයවැය භාවිතා කර නොතිබුණු අතර අයවැය ගත කරන ලද වියදම සත්‍ය වියදම සමඟ සැසඳීමේදී සියයට 1 සිට සියයට 1567 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ඒකකයක් ලෙස යොදා ගැනිමට අවධානය යොමු කර ඇත. එහෙත් අවස්ථානුකූලව අනුමත කෙරෙන ඇතැම් අත්‍යවශ්‍යාය වියදම් හේතුවෙන් වර්ෂයේ අවසාන දිනට වෙන ඇතැම් වියදම් සඳහා වන වැය විෂයන් කිහිපයක් පමණක් විචලනයක් පවති. | විධිමත් අයවැය පාලනයන් සහිතව අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අයවැය ප්‍රතිපාදන තුළින් රු. මිලියන 3.41 ක් වෙන්කර තිබුණද | අවස්ථානුකූලව අවශ්‍ය මිලදී ගැනිම් හේතුවෙන් වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවී ඇති අතර, එවැනි අතිරේක අවශ්‍ය | විධිමත් අයවැය පාලනයන් සහිතව අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂ අවසානයට රු. මිලියන 7.1 ක ස්ථාවර වත්කම් මිලදී ගැනීම හේතුවෙන් අයවැය ප්‍රතිපාදනවලට වඩා සත්‍ය වියදම රු. මිලියන 3.69 කින් වැඩි වී තිබුණි. | මුදල් අධිකාරියේ අභ්‍යන්තර අරමුදලෙන් සභාපතිගේ විශේෂ අනුමැතියකින් පමණක් මිලදී ගෙන ඇත. | |

**4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව, ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද අධිකාරිය විසින් 2016 සිට 2020 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා, 2022 මැයි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 සිට 2020 දක්වා වූ වාර්ෂික වාර්තා 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද අමාත්‍යාංශයීය කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරන ලද අතර, එම වාර්තා 2021 නොවැම්බර් මස 30 වැනි දින පාර්ලිමේන්තුවේ දී සභාගත කිරීමට තීරණය කර ඇත.<br>2021 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ වන විට කෙටුම්පත් කර අවසන් කර ඇති අතර එම වර්ෂය සඳහා වූ අවසන් විගණන වාර්තාව ලද විගසම ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. | වාර්ෂික වාර්තා අප්‍රමාදව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |